මගේ අංකය : JSC/SEC/CIR-L/2025

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 14/2025

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්, සියලුම අධිකරණ නිළධාරින් සහ සියලුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් වෙත,

<u>2025 වර්ෂයට අදාලව වාර්ෂික සහ පශ්චාත් විශ්‍රාම වත්කම් හා බැරකම් ප්‍රකාශ 2025.08.31 දිනෙන් පසුව භාරගැනීම සම්බන්ධයෙනි</u>

ශිර්ෂගත කරුණට අදාලව අල්ලස් හෝ දූෂණ චෝදනා අධ්‍යක්ෂ ජනරාල් ආර්.එස්.ඒ. දිසානායක මහතා විසින් යොමුකරන ලද අංක DG/CA/AD/144 දරන 2025.09.16 දිනැති ලිපිය සහ ඇමුණුම පිළිබඳ සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව එම ලිපිය සහ ඇමුණුම සුදුසු කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක් කරන ලෙස මෙයින් දන්වමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 ඔක්තෝම්බර් මස 14 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය

ANNEXE A-35

24 SEP 2025

# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

## இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

## COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION


තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


මගේ අංකය: DG/CA/AD/144

2025.09.16

සියලු ආයතන ප්‍රධානීන් වෙත,

**2025 වර්ෂයට අදාලව වාර්ෂික සහ පශ්චාත් විශ්‍රාම වත්කම් හා බැරකම් ප්‍රකාශ 2025.08.31 දිනෙන් පසුව භාරගැනීම සම්බන්ධයෙනි.**

2025 වර්ෂයට අදාලව **වාර්ෂික සහ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශ** ඉදිරිපත් කිරීමට නියමිත දිනය එනම්, 2025.06.30 වන දින දක්වා ද, දඩ මුදල් අයකරන කාලය එනම් 2025.07.01 සිට 2025.08.31 දක්වා ද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබාගැනීම සිදුකරන ලදි.

02. 2025.09.01 දා තෙක් තම වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන තැනැත්තන් සම්බන්ධයෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 90(5) වගන්තිය ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගනු ලැබේ.

පනතේ 90(5) වගන්තිය පහත පරිදි වේ.

> *''වාර්ෂික ප්‍රකාශය හෝ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය අවස්ථාවෝචිත පරිදි, අදාල වර්ෂයේ සැප්තැම්බර් පළමු වන දා තෙක් යැවීමට අපොහොසත් වන තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී, එකී තැනැත්තා විසින් අවසන් වරට ලබාගත් මාස දොළහක දළ වැටුප්වලට සමාන දඩ මුදලකට හෝ අවුරුද්දකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩ මුදල සහ බන්ධනාගාර කිරීමකට හෝ එකී දඩ මුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතුය.''*

03. එසේ හෙයින් 2025.08.31 පසුව ලබාදෙන **වාර්ෂික ප්‍රකාශ** සහ **පශ්චාත් විශ්‍රාම ප්‍රකාශ** භාරගැනීම අවශ්‍ය නොවන අතර, යම් හෙයකින් එසේ භාරගෙන ඇත්නම් එම ප්‍රකාශ අදාල ප්‍රකාශකයා වෙත නැවත යොමුකල යුතුය. තවදුරටත්, 2025.08.31 දිනට සිය වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිදුකිරීමට අපොහොසත් වන තැනැත්තන්ට විරුද්ධව ඉහත 90(5) වගන්තිය ප්‍රකාරව නඩු පැවරීමෙන් පසුව යම් අවස්ථාවකදී එම ප්‍රකාශ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත භාරදීමට සිදුවන බව ඔවුනට දැන්වීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කල යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ආර්.එස්.ඒ.දිසානායක**

අධ්‍යක්ෂ ජනරාල්

**වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශය**


දුරකථන අංක - 0112596359
0767011954

ඊමේල් ලිපිනය - assetsciaboc@gmail.com
ෆැක්ස් අංකය - 0112587287

# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
## இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
## COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION


තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


My No: DG/CA/AD/144
2025.09.16

සියලු ආයතන ප්‍රධානීන් වෙත,

**<u>2025 වර්ෂයට අදාලව පළමු පත්වීමේ ප්‍රකාශ, ධූරකාලය අවසානයේදී හෝ විශ්‍රාම යාමේදී සිදුකරනු ලබන ප්‍රකාශ සහ තත්කාර්ය ප්‍රකාශ සම්බන්ධයෙනි.</u>**

ඔබ ආයතන විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමුකරන ලද වත්කම් සහ බැරකම් ප්‍රකාශ අප විසින් අද දින දක්වා භාරගැනීම සිදුකරන ලද බව මෙමඟින් දැනුම් දෙමි.

02. මින් ඉදිරියට 2025 වර්ෂයට අදාලව ඔබ විසින් ලබාගන්නා මෙහි නම් සඳහන් ප්‍රකාශ එනම්, පළමු පත්වීමේ ප්‍රකාශය, ධූරකාලය අවසානයේදී හෝ විශ්‍රාම යාමේදී සිදුකරනු ලබන ප්‍රකාශය සහ තත්කාර්ය ප්‍රකාශය සම්බන්ධයෙන් පහත වගුවේ දක්වා ඇති තොරතුරු පමණක් අප වෙත යොමුකර, අදාල ප්‍රකාශ සුරක්ෂිතව ඔබගේ භාරයේ තබාගත යුතු අතර කොමිෂන් සභාව විසින් සිදුකරන විමසීමක දී එම ප්‍රකාශ කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කල යුතුය.

| ආයතනයේ නම | | | | | |
|---|---|---|---|---|---|
| කොමිෂන් සභාව විසින් පෙර ප්‍රකාශ භාරගැනීමක් සිදුකර ඇත්නම්, අදාල කුවිතාන්සි අංකය | | | | | |
| අංකය | නිලධාරියාගේ නම | තනතුර | ප්‍රකාශ වර්ගය | පත්වීමේ දිනය/ විශ්‍රාම දිනය/ වටිනාකමේ සුවිශේෂී වෙනසක් සිදු වූ දිනය | ප්‍රකාශය භාර දුන් දිනය |
| | | | | | |

03. අදාල තොරතුරු ලිපිකවරයක බහා වම්පස ඉහළ කෙළවර 'වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශය- තොරතුරු' ලෙස සඳහන් කර ලියාපදිංචි තැපැල හරහා අපවෙත යොමුකිරීමට කාරුණික වන්න.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආර්.එස්.ඒ.දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්

වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශය

දුරකථන අංක - 0112596359
0767011954

ඊමේල් ලිපිනය - assetsciaboc@gmail.com
ෆැක්ස් අංකය - 0112587287